*සැ. යු.-* 2022.12.02 දින පළ කරන ලද අංක 2309 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස් පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,310 - 2022 දෙසැම්බර් මස 09 වැනි සිකුරාදා - 2022.12.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 868 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 දෙසැම්බර් මස 30 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 දෙසැම්බර් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


871- B 082408— 353 (2022/12)
D 1 -

# පිස්කල් විකිණීම්

## කොළඹ දිසා අධිකරණයේ දී ය

කොළඹ 01, ජනාධිපති මාවතේ, අංක 69 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි කොළඹ 03, ගාලු පාර, අංක 56 දරන ස්ථානයේ ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යනු ලැබූ සහ (දැනට) කොළඹ 04, ගාලු පාර, අංක 101 දරන ස්ථානයේ ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යනු ලබන සීමාසහිත සෙලින්කෝ බිල්ඩිං සොසයිටි.

............*පැමිණිලිකරු.*

නඩු අංකය : 17826/MB
මතුගම දිසා අධිකරණය
ඇස්කිසි අංකය : 76/2022

අගලවත්ත, කපුගම 'ඉද්ද' හි පදිංචිව සිටි සහ දැනට මතුගම, පාන්තිය, පල්ලියගොඩ උතුර, මංගල පාර, අංක 39/ඒ/1 හි පදිංචි කොලොන්නෙ අප්පුහාමිලාගේ සනත් පත්මකුමාර කොලොන්නෙ.

............*විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩු වාර්තාවේ ඇතුළත් කර ඇති වර්ෂ 2008 ක් වූ පෙබරවාරි මස 29 වැනි දිනැති ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාර විත්තිකරු විසින් ශ්‍රී ලංකාවේ මුදලින් හිඟ රු. 31,79,842/68 ක මුදලක් සහ රු. 7,89,551.39ක මුදලක් මත වර්ෂ 2006ක් වූ අගෝස්තු මස 21 වැනි දින සිට තීන්දු ප්‍රකාශිත දින දක්වා වසරකට 20% බැගින් පොළියක් අයකර ගැනීමටත්, ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සඳහන් මුලු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් මෙම තීන්දු ප්‍රකාශයේ දින සිට නෛතික පොළිය ද නඩු ගාස්තු ද, විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා එකී විත්තිකරුට එරෙහිව ක්‍රියාවේ යෙදවීම සඳහා මා වෙත නිකුත් කර ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට ආඥකොට ඇති බැවින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එච්. එම්. ඩී. බණ්ඩාර විසින් සහතික කළ වර්ෂ 2004.12.20 දිනැති හා අංක 36 දරන උකස්කරය පදනම් කරගෙන ඉහත කී රු. 7,89,551.39ක මුදලක් මත වර්ෂ 2006ක් වූ අගෝස්තු මස 21 වැනි දින සිට තීන්දු ප්‍රකාශිත දින දක්වා වසරකට 20% බැගින් පොළියක් අයකර ගැනීමටත්, නඩු ගාස්තු ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපල එකී පහත විස්තර කර ඇති දේපලට අයත් සියලුම අයිතිවාසිකම් පරවශ්‍යතා සහ අනුබද්ධිතයින් ද, විත්තිකරුගෙන් කවර ආකාරයෙන් හෝ සියලු අයිතිවාසිකම් හිමිකම් බලපුලුවන්කාරකම්, හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපලෙන් උපදන සහ එකතුවන සියලු කුළී ලාභ සහ අනිකුත් ආදායම් ද සියලු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද ඇතුලුව මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපල නිශ්චිතවම බැඳී ඇති බව හා ඇස්කිසි කලහැකි බව ප්‍රකාශ කරන ලද හෙයින් ද, අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයෙ හි විස්තර කර ඇති දේපල,

වර්ෂ **2023ක් වූ ජනවාරි මස 03 වැනි දින පෙ. ව. 11.00ට** ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් 25%ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද රජයට අයවිය යුතු ගාස්තු (පවුන්ඩ්ජ් ගාස්තු) තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, ගැසට් පත්‍රයේ ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් ද එවලේම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් බාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් 75%ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පස්දුන් කෝරලේ, ඉද්දගොඩ පත්තුවේ මතුගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පල්ලියගොඩ උතුර පිහිටි බණ්ඩිමානගෙවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කැප්ටන් කේ. විතාන මහතාගේ අංක 786 සහ 1997/05/15 දිනැති පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද අංක 2ඒ දරන කැබැල්ලට මායිම්, උතුරට : එම පිඹුරේම කැබලි අංක 2බී සහ 2සී ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එච්. ඕ. ශරෙන්ගුයිවේල් මහතාගේ 1922/02/06 දිනැති අංක 4332 දරන පිඹුරේ කැබලි අංක 4 සහ 5 ද, දකුණට : එකී අංක 4332 දරන පිඹුරේ කැබලි අංක 3 ද, බස්නාහිරට : එකී අංක 4332 දරන පිඹුරේ කැබලි අංක 1 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම පහ (පර්. 12.5) විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ, පලතුරු ගොඩනැගිලි ආදී සියලු දේ ද සහ ඉහත කී අංක 786 දරන පිඹුර ප්‍රකාර 2සී කැබැල්ලේ මාර්ග සහ වෙනත් අයිතීන් ද සමග වේ. මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්පත්‍ර/ඉරු සී 324/239 හි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මතුගම.

වර්ෂ 2022 ක් වූ ඔක්තෝබර් මස 21 වැනි දින දී ය.

12-263

# විවිධ දැන්වීම්

## කොළඹ දී පැවැත්වෙන (සිවිල් සහ වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයේදීය)

රණාල, නවගමුව, අවිස්සාවේල්ල පාර අංක 81/බී හි එන් ඇන්ඩ් ඒ ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සම්බන්ධ කාරණයේ දී ය.

සහ

නඩු අංකය : HC/Civil/04/2021/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
කාර්යපටිපාටිය : ලඝු
වටිනාකම : රු. 138,310,110

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ඈවර කිරීම සඳහා වූ කරනු ලබන ඉල්ලීම පිළිබඳ කාරණයේ දී ය.

LOLC ෆයිනෑන්ස් පීඑල්සී, (කලින් ලංකා ඔරික්ස් (ෆයිනෑන්ස් පීඑල්සී ලෙස නම් කර හඳුන්වනු ලැබූ)

(නව සමාගම් අංකය - පීබී 244 පීකියු)

ලියාපදිංචි කාර්යාලය
අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය

..................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් වාණිජ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 100/1 යන ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි එල්. ඕ. එල්. සී. ෆයිනෑන්ස් පී. එල්. සී. සමාගම විසින් වර්ෂ 2021 ක්වූ ජනවාරි මස 11 වැනි දින කොළඹ දී පැවැත්වෙන සිවිල් සහ වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම වර්ෂ 2023ක් වූ මාර්තු මස 01 වන දින අධිකරණය ඉදිරියේ විභාග කිරීමට නියමිත බවත්, එම පෙත්සමට අදාල නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැලකර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණය හිමියෙකු හෝ සහදායකයෙක් වේ නම් ඒ සඳහා තමා ම හෝ සිය නඩුව මෙහෙයවන නිතිඥවරයා හෝ ලේඛණගත නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේ දී පෙනී සිටිය හැකි බවත්, එකී පෙත්සමේ පිටපතක් ලබාගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන් කළේ :- නීතිඥ නුවන් ජයසිංහ, අංක 22, ෂේඩ් ග්‍රෝව් ඇවනියු, කොළඹ 08.

සටහන :- එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතොත් එසේ කිරීමට තමා අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් නීතිඥ නුවන් ජයසිංහ වෙත ගෙනැවිත් භාරදිය යුතු හෝ තැපැලෙන් එවිය යුතුවේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් නම්, එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ හෝ **නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ 2023ක් වූ පෙබරවාරි මස 28 වැනි දින පස්වරු 6.00** ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනවිත් භාර දිය යුතුය. නැතහොත් එපරිදි තැපැලෙන් එවිය යුතුය.

12-269

**ආර්ය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

වීරසුමන වීරසිංහ වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝගය යටතේ "ආර්ය පදනම'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි.

01. ජාතික හා ග්‍රාමීය නායකයින් පුහුණු කිරීම,
02. සිසුන්ට අධ්‍යාපනය, ක්‍රීඩා සහ කලා කටයුතුවලට උපකාර කිරීම.
03. පරිසර සංරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

යනාදිය වේ.

වීරසුමන වීරසිංහ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

12-310

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.